මලික් සමරවික්‍රම FCMA
மலிக் சமரவிக்கிரம FCMA
MALIK SAMARAWICKRAMA FCMA
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය
அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்
MINISTER OF DEVELOPMENT STRATEGIES & INTERNATIONAL TRADE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | MODSIT/T/AD3/2018 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018.06.22 |

අස්ගිරි පාර්ශවයේ අනු නායක අති පූජ්‍ය ආනමඩුවේ ධම්මදස්සි නාහිමිපාණෝ
අස්ගිරි මහා විහාරය

ගෞරවනීය අනු නායක ස්වාමීන්වහන්ස,

**2018 ජනවාරි මාසයේ දී අත්සන් කරන ලද ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම**

ඉහත නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ නියෝජනය කරමින් රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ සභාපති ඇතුළු නියෝජිතයන් පිරිසක් මහා නායක ස්වාමීන් වහන්සේලා සමඟ සිංගප්පූරු වෙළඳ ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව 2018.06.21 දින පැවති සාකච්ඡාව සම්බන්ධයෙන් කරුණු මාධ්‍ය මගින් මා හට දැනගැනීමට ලැබී ඇත. අදාල කරුණු දැක්වීමේ දී සාවද්‍ය ලෙස කරුණු දක්වා ඔබවහන්සේලා හිතාමතාම නොමග යැවීමට උත්සාහ දරා ඇති බව කනගාටුවෙන් වුවද දන්වනු කැමැත්තෙමි.

2018.01.23 දින අත්සන් කරන ලද සිංගප්පූරු වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් නිවැරදි කරුණු අති පූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලාට ඉදිරිපත් කිරීම මාගේ හා මාගේ අමාත්‍යාංශ නිලධාරීන්ගේ වගකීමක් වන බැවින් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ගෞරවපූර්වකව ඔබවහන්සේලාට ඉදිරිපත් කරමි.

සිංගප්පූරු වෙළඳ ගිවිසුම අත්සන් කිරීමේදී නිසි පරිදි කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා නොගෙන 2018.01.23 දින එය අත්සන් කර ඇති බව කරුණු දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් වන නිවැරදි තොරතුරු පහත දක්වා ඇත.

2016 අගෝස්තු මස 15 සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව අතර නිල වශයෙන් මෙම ගිවිසුම සම්බන්ධව සාකච්ඡා දියත් කරන ලදී. ගිවිසුමේ විෂයපථය තීරණය කිරීමේ සාකච්ඡා වටයකින් ආරම්භ වූ සාකච්ඡාවලදී ශ්‍රී ලංකා පාර්ශවයෙන් සාකච්ඡා මෙහෙයවන ලද්දේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර වෙළඳාම හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල ප්‍රවීනයන්ගෙන් යුත් කමිටුවක් මගිනි. එය වාණිජ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යන මෙම විෂයට අදාලව රාජකාරි සිදු කරන රාජ්‍ය ආයතන වලින් නම් කරන ලද නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවකි. මෙම ප්‍රධාන සාකච්ඡා කමිටුවට තාක්ෂණික කරුණු සැපයීම සඳහා අදාල සියලු රාජ්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත උප කමිටු ගණනාවක් පිහිටුවන ලද අතර එම කමිටුවලට ශ්‍රී ලංකා මහ බැංකුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, විදුලි සංදේශ නියාමන කොමිසම, ICTA ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය යනාදී ආයතනයන්හී නියෝජිතයන් අන්තර්ගත විය. 2016 සිට 2017 කාලය තුලදී රටවල් දෙකෙහි සාකච්ඡා කණ්ඩායම් දෙක අතර සාකච්ඡා වට 8 ක් පැවැත්වුණි. අදාල, මාස 18 ක කාලය තුල විවිධ පාර්ශව සමඟ දැනුවත් කිරීමේ සාකච්ඡා වට 20 කට වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | 011-2395133/135/138 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 011-2395139/133 | 25 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව<br>25 வது மாடி, மேற்கு கோபுரம், உலக வர்த்தக மையம், கொழும்பு 1, இலங்கை<br>Level 25, West Tower, World Trade Centre, Colombo 01, Sri Lanka |

මෙසේ සාකච්ඡා කරන ලද ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි පළමු කෙටුම්පත 2017 දෙසැම්බර් මස 22 වන දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. එය 2018 ජනවාරි 9 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට බඳුන් කරන ලදී. එහිදී ගිවිසුම් කෙටුම්පත පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ඇතුළු තවත් කැබිනට් අමාත්‍යවරු 14 දෙනෙකු නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද අතර ඒවා සියල්ල සුභදායී නිරීක්ෂණ විය. එම නිරීක්ෂණ මගින් පෙන්වන ලද කරුණු මෙන්ම විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ ද සැලකිල්ලට ගනිමින් නීතිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අවසන් ගිවිසුම් කෙටුම්පත සකස් කරන ලදී. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් පරිදි, නීතිපතිවරයාගේ අනුමැතිය සහිතව සංශෝධිත කෙටුම්පත් ගිවිසුම අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට නැවත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. එහිදී, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයාට එම ගිවිසුමට එළැඹීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018 ජනවාරි මස 16 වන දින ලබා දෙන ලද අතර ඒ අනුව 2018 ජනවාරි මස 23 වන දින ගිවිසුම අත්සන් කරන ලදී. එබැවින් මෙම ගිවිසුම නීත්‍යානුකූල නොවන ලෙස අත්සන් තබන ලද ගිවිසුමක් යැයි සිදු කරන ප්‍රකාශයන්ගේ කිසිදු සත්‍යතාවයක් නොමැත.

තවත් වැදගත් කරුණක් වන්නේ, මෙම ගිවිසුම බලාත්මක කිරීමට පෙර අන්තර්ජාතික භාණ්ඩ වෙළඳාම හරහා ඇතිවිය හැකි කිසියම් හෝ අනර්ථකාරී බලපෑමක් දේශීය කර්මාන්තවලට සිදුවීම වළක්වා ගැනීමට ඕනෑම රටක තිබිය යුතු එහෙත් ශ්‍රී ලංකාවේ මෙතෙක් කලකට නොතිබූ නීතිමය රාමුව ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රපාතන විරෝධී හා ප්‍රතිතෝලන පනත සහ ආරක්ෂණ පියවර පනත යන පනත් පාර්ලිමේන්තුවේ සම්මත විය යුතු බවට නීතිපතිතුමා විසින් දෙන ලද උපදෙස් අනුව 2018 ජනවාරි මස 23 වන දින මෙම ගිවිසුම අත්සන් කල ද, ගිවිසුම නීතිමය වශයෙන් බලාත්මක කරන ලද්දේ ඉහත කී පනත් දෙක, 2018 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුව එළඹි 2018 මැයි 01 දින වීමය.

රජයේ වෛද්‍ය නිලධාරී සංගමය විසින් ජුනි මස 21 දින අස්ගිරි පාර්ශවයේ මහානායක අති පූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන හිමියන්, අනුනායක අති පූජ්‍ය ආනමඩුවේ ධම්මදස්සී හිමියන් සහ අස්ගිරි ලේඛකාධිකාරී පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමියන් බැහැදැක සාවද්‍ය ලෙස පවසන ලද තවත් කරුණක් වූයේ ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් අදටත් රජයට නොමැති බවයි. සිංගප්පූරු වෙළඳ ගිවිසුමට අදාලව අතිගරු ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ මගින් මෙම වෙළඳ ගිවිසුම ජාතික වෙළඳ ප්‍රතිපත්තියට අනුකූලව සිදුවිය යුතු බවපෙන්වා දී තිබිණ. එහිදී සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා වන මා ද, අමාත්‍යාංශ ලේකම්වරිය සහ නැසීගිය ආර්ථික විශේෂඥ ආචාර්ය සමන් කැලේගම මහතා ඇතුළු පිරිසක් ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් අවශ්‍ය නොවන්නේ යැයි පැවසූ බවට රජයේ වෛද්‍ය නිලධාරී සංගමය සාවද්‍ය කරුණු ඉදිරිපත් කර තිබූ බව වාර්තා වී ඇත. මෙය සම්පූර්ණයෙන්ම ඔබවහන්සේලාට කරුණු විකෘති කර දැක්වීමක් වන අතර රටේ ආර්ථික ප්‍රතිපත්ති රාමුවට අනුව යමින් ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කොට එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු 2016 මුල සිටම සිදුකළ බවට ගෞරව පූර්වකව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

සත්‍ය කරුණු මෙසේ තිබියදී අස්ගිරි ලේඛකාධිකාරී පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමියන් විසින් මේ සම්බන්ධයෙන් නිල වශයෙන් කටයුතු කරන කිසිදු පාර්ශවයකින් කරුණු විමසීමකින් තොරව රජයේ වෛද්‍ය නිලධාරී සංගමය විසින් ඒකපාර්ශිකව පවසන ලද කරුණු පමණක් දැන අසා, මෙම කටයුත්තේදී "වංචනික දෙයක්" සහ "රටට අවාසිදායක දෙයක්" සිදුව ඇති බවට ප්‍රකාශ කිරීම පිළිබඳව පෞද්ගලිකවම අතිශයෙන් කණගාටු වෙමි.

2017.08.01 දින අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ නව වෙළඳ ප්‍රතිපත්තිය සම්මත කරන ලදී. එහි පිටපතක් මේ සමඟ අමුණා එවමි. මෙම ප්‍රතිපත්තිය එළි දක්වන ලද්දේ 2016 වර්ෂයේ සිට වසරකට ආසන්න කාලයක් තුලදී ජාත්‍යන්තර වෙළඳාමට අදාල සියළු රාජ්‍ය ආයතනවල අදහස් විමසා ඉන් අනතුරුව කර්මාන්ත සංගම් හා වණිජ මණ්ඩලවල අදහස් ලබා ගැනීම පිණිස ඉදිරිපත් කිරීමෙන් පසුවය. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විශේෂඥ දැනුම සහිත, ජනාධිපතිතුමාගේ ආර්ථික උපදේශක ආචාර්ය සරත් රාජපතිරණ මහතාගේ මූලිකත්වයෙන් යුතු කමිටුවක් විසින් නව වෙළඳ ප්‍රතිපත්තියේ කෙටුම්පත් ගණනාවක් සකස් කොට සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙය අවසන් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය නව වෙළඳ ප්‍රතිපත්තිය ලෙස නම් කර ඇති බැවින් එහි නමෙහි ඇති වෙනසක් හුවා දක්වමින් මෙය ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් නොවන බවට විවිධ පාර්ශවයන් මුලා කිරීමේ ප්‍රයත්නයක එම සංගමය යෙදී සිටියි.

එසේම මෙම ගිවිසුම මගින් කිසිදු සිංගප්පූරු පුරවැසියෙකුට හෝ ස්ථිර පදිංචිකරුවෙකුට වෘත්තීය සේවා සැපයීම සඳහා නිදහසේ මෙරටට පැමිණීමට අවස්ථාව හිමිනොවන අතර ඉංජිනේරු හා ගෘහ නිර්මාණ සේවා නිදහස් කර ඇති බවට වන ප්‍රකාශ ද සම්පූර්ණයෙන්ම අසත්‍ය වේ.

මීට අමතරව පුද්ගල සේවා සැපයීම සඳහා සිංගප්පූරු "මිනිස් බල" (Man Power) සමාගම පිහිටුවීමට මෙම ගිවිසුම හරහා ඉඩ ලබා දී ඇති බවටද, මේ ඔස්සේ ගෘහ සේවිකාවන්, පෙදරේරු හා කම්කරු යනා දී වෘත්තිකයන්ට පවා ඉන්දියාව, බංගලාදේශය වැනි වෙනත් රටවලින් මෙරටට පැමිණීමට හැකි බවට ද චෝදනා එල්ල වී තිබේ. මෙය මුළුමනින්ම වැරදි ප්‍රකාශයක් වන අතර එවැනි කිසිදු කොන්දේසියක් හෝ වගන්තියක් මෙම ගිවිසුමට ඇතුළත්ව නැත.

මෙම ගිවිසුම ගලේ කෙටූවක් මෙන් සදා වෙනස් කළ නොහැකි ලියවිල්ලක් නොවේ. ගිවිසුම අත්සන් කිරීමෙන් වසරක් ඉක්ම යාමට පෙර එහි අඩංගු කරුණු විමර්ශනයට ලක් කොට ගිවිසුමට අදාළ පාර්ශව දෙකෙන් එකකට එහි යම් වෙනස්කමක් සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම් එය සාකච්ඡා කිරීමෙන් පසු දෙපාර්ශවයේම එකඟතාවය ඇතිව සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගිවිසුමේම අඩංගු වී තිබේ. තවදුරටත් ගිවිසුමේම අඩංගු වන කරුණක් වන්නේ දෙපාර්ශවයෙන් එකකට මෙම ගිවිසුම සම්පූර්ණයෙන් අවලංගු කිරීමට අවශ්‍ය වන්නේ නම් මාස 12 ක පෙර දැනුම් දීමකින් පසුව එයද සිදුකළ හැකි වීමය.

මෙම ගිවිසුම හරහා දේශීය කර්මාන්ත, තාක්ෂණික විශේෂඥතාවයන් හා සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමටත්, ගෝලීය නිෂ්පාදන ජාල තුල ශ්‍රී ලංකාවේ සක්‍රීය සහභාගිත්වයක් සිදු කිරීමටත් වඩා සුදුසු තත්වයකට එළඹෙනු ඇත. ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම, නැගෙනහිර ආසියානු වෙළඳපොලවල් වෙත පිවිසීම හා ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සඳහා ඇති හැකියාව ඉහල දැමීම සම්බන්ධයෙන් සිදු කරන ලද සුවිශේෂී පියවරක් ලෙස දැක්විය හැකි අතර ඒ හරහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා අවශ්‍යම කෙරෙන කරුණක් වන ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධවීමේ හැකියාව ඇති කෙරේ.

සිංගප්පූරුව වැනි ගෝලීය ආර්ථිකයේ ඉතා ඉහළ කාර්ය සාධනයක් දක්වන රටක් සමඟ අන්තර් ජාතික වෙළඳ ගිවිසුමක් ඇති කර ගැනීම ශ්‍රී ලංකාව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් වන අතර ඒ හරහා නැගෙනහිර ආසියාතික කලාපය තුළට අපගේ අපනයන වලට පිවිසීමට ඇති දොරටු විවර වන අතර විදේශීය ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා මෙම ගිවිසුම මගින් ශ්‍රී ලංකාව පිළිබඳව ලෝකයට දෙන පණිවිඩය පිටුවහලක් වනු ඇත. දැනටමත් හම්බන්තොට හා ත්‍රිකුණාමලය වැනි ග්‍රාමීය ප්‍රදේශවල ඩොලර් බිලියන 1.4 කට ආසන්න ආයෝජන ප්‍රමාණයක් සහිතව අපනයන අභිමුඛ කොට ගත් තිරිඟු පිටි නිෂ්පාදන කර්මාන්තයක්, වානේ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක්, සීනි කර්මාන්ත ශාලාවක්, පෙට්‍රෝ කෙමිකල් කර්මාන්ත ශාලාවක් වැනි මහා පරිමාණ විදේශ ආයෝජන සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වී ඇත.

ඔබ වහන්සේලාට ගෞරවාන්විතව ඉදිරිපත් කරන ලද මෙම කරුණු මගින් ශ්‍රී ලංකා සිංගප්පූරු වෙළඳ ගිවිසුම හා එය සකස් කිරීම පිළිබඳව වන යථා තත්ත්වය පිළිබඳව පැහැදිලි වනු ඇති බව හුදෙක්ම විශ්වාස කරමි. ඒ අතරම රජයේ වෛද්‍ය නිලධාරී සංගමය වැනි මේ රටේ වැදගත් වෘත්තිකයන් පිරිසක් පටු පරමාර්ථ සහිතව මේ පිළිබඳ කරුණු විකෘති සහගත ලෙස ඉදිරිපත් කරමින් මහජනතාව නොමග යැවීමට ගන්නා උත්සාහය පිළිබඳව කලකිරීමට පත්වෙමි. මේ පිළිබඳව ඔබ වහන්සේලා බැහැදැක තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

*ශ්‍රී ලාංකික ජනතාවගේ ආර්ථික අභිවෘර්ධිය පිණිස අන්තර්ජාතික වෙළඳ විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ජාතික යහපත උදෙසා කටයුතු කිරීමට මා වෙත පැවරී ඇති වගකීම නොපිරිහෙළා තවදුරටත් සිදු කරන බව නමස්කාර පූර්වකව දන්වා සිටිනු කැමැත්තෙමි.*

මලික් සමරවික්‍රම (පා.ම.)
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය